**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2019**
**-------------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‟මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකරණ නියෝග මත රඳවා ගන්නා ලද අලින්ගේ වටිනාකම ගිණුම්වල දක්වා නොතිබියදී අධිකරණ නියෝග මත රඳවා ගන්නා ලද අලියෙකු අදාල හිමිකරුට ලබා දීමේදී රු.7,169,787 ක් වටිනාකම තක්සේරු කර ගිණුම්වලින් ඉවත් කර දක්වා තිබුණි. එම හේතුවෙන් ප්‍රදර්ශනය සඳහා වූ සතුන්ගේ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී වටිනාකම රු.6,754,123 ක් වූ ගෝනපල ගොවිපලේ වගා කරන ලද භෝග සත්වෝද්‍යානය වෙත ලබා දී තිබූ නමුත් එම වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ භාණ්ඩාගාර සටහන්හි දක්වා ඇති ආරම්භක හා අවසාන ශේෂ සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.14,364,779 ක හා රු.29,560,741 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2,952,854,896<br>2,957,096,088 | **2,923,294,155**<br>2,**942,731,309** | 29,560,741<br>14,364,779 | ඉදිරි වර්ෂයේ ගිණුම තුලින් නිරූපණය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපියේ පාස්කු ප්‍රහාරය හේතුවෙන් සත්වෝද්‍යානවල පවත්වා ගෙන යනු ලබන වෙළඳසැල් 2019 අප්‍රේල් සිට ජූනි දක්වා වසා තබන ලද කාල සීමාවට අදාළව ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බව දන්වා තිබුණද 2020 ජූනි දක්වා එලෙස තීරණයක් ගෙන නොතිබුණි. මේ අනුව | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය පරිදි 2019.12.27 හා 2020.01.29 දිනැති ලිපි මගින් අමාත්‍යාංශය හරහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. මේ වන තෙක් ඒ සඳහා පිළිතුරක් නොලැබුණු බැවින් කුලී අයකිරීමක් සිදු නොකරන ලදී. ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු | හිඟ බදු කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.4,782,701 ක් වූ හිඟ බදු කුලිය 2020 ජුනි දක්වාම අයකරගෙන නොතිබුණි. | කරන බව දන්වා ඇත. | |
| (ආ) | එකතු කළ අගය මත බදු ගණනය කිරීමේදී පාලන ගිණුමක් පවත්වා නොගැනීම හේතුවෙන් ඉකුත් වර්ෂයේ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය රු.4,841,740 ක් සම්බන්ධයෙන් සැලකිල්ලට නොගෙන සමාලෝචිත වර්ෂයේදී රු.2,005,771 ක එකතු කළ අගය මත බදු ගෙවා තිබුණි. එම නිසා ඉකුත් වර්ෂයේ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබා ගෙන ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව දන්වා ඇත. | පාලන ගිණුමක් පවත්වා ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති හා අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි සිදු කරන බව දන්වා ඇත. | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| | (i) 7.12.2(ආ) වගන්තිය | ලංසු ඉදිරිපත් කළ එකම තැනැත්තා විසින් සඳහන් කර ඇති මිල අධික නම් මිල අඩු කිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව ලංසුකරු සමග සාකච්ඡා කළ යුතු වුවත් එසේ සිදු නොකිරීම හේතුවෙන් වෙළඳපල මිලට වඩා වැඩි මිලට සියළු සත්වෝද්‍යාන | ටෙන්ඩරය සඳහා එක් ලංසුවක් පමණක් ඉදිරිපත් වී තිබූ අතර එම ලංසුව ඇස්තමේන්තු ගත පිරිවැයට වඩා 17% ක් අඩුවිය. එබැවින් තාක්ෂණික කමිටුවට ලංසුකරු සමඟ සාකච්ඡා කිරීමේ | ගිවිසුම්වලට එළඹීමේදී වෙළඳපලේ පවත්නා මිල පිළිබඳ සැලකිලිමත්ව තීරණ ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා කුකුල් මස් සපයා තිබුණි. එම හේතුවෙන් වැඩි වියදමක් දැරීමට සිදු වී තිබූ බව නිරීක්ෂණය විය. | අවශ්‍යතාවයක් නොවූ අතර එම ලංසුකරු වෙත ටෙන්ඩරය ප්‍රදානය කරන ලදී. | |
| (ii) 3.6.2 (අ) වගන්තිය | නැවත ඇණවුම් සිදු කිරීමට පෙර සැපයුම්කරු සමඟ සාකච්ඡා කොට වඩා වාසි සහගත තත්ත්වයක් ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව සෑම උත්සාහයක්ම දැරිය යුතු නමුත් එසේ සිදු කිරීමකින් තොරව 2019 මැයි මාසයෙන් කොන්ත්‍රාත් කාලය අවසන් වූ දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රධාන ආපනශාලාව 2019 ජූනි මාසයේ සිට නැවතත් එම සැපයුම්කරු වෙතම ලබා දී තිබුණි. | මෙම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේදී කොන්ත්‍රාත්තුව මිල වැඩිකිරීමට කටයුතු නොකරන ලද බව දන්වා ඇත. | ටෙන්ඩර් කාලසීමාව අවසන් වූ පසුව නැවත ටෙන්ඩර් කැඳවා කොන්ත්‍රාත්තුව ලබා දිය යුතුය. |
| (iii) 7.9.2 වගන්තිය | ඇගයුම් කළ අවම මිල සහිත ප්‍රතිචාරාත්මක ලංසුව සැහෙන ආන්තිකයකින් ඇස්තමේන්තුව ඉක්මවන්නේ නම් අධික පිරිවැයට හේතු කවරේදැයි විමර්ශනය කර අලුතින් ලංසු කැඳවීම සඳහා සලකා බැලිය යුතු වුවද ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2019/2020 වර්ෂය සඳහා විවිධ වර්ගයේ සත්ව ආහාර මිලදී ගැනීම සඳහා පිළියෙල කරන ලද ඇස්තමේන්තු අනුව පිරිවැය හා එකඟ වූ මිල ගණන් සැසඳීමේදී සියයට 15 සිට සියයට 129 ක් වූ පරාසයක විචලතාවන් තිබියදීත් ඒ පිළිබඳව විමර්ශනය නොකර සැපයුම්කරුවන්ට ලබාදී තිබුණි. | පින්නවල සත්වෝද්‍යානයේ විවිධ ආහාර ටෙන්ඩරයේ මිල ගණන් පමණක් ලංසුකරු සමඟ සාකච්ඡා කර අඩු කර ගැනීමට කටයුතු කර ඇති බව දන්වා ඇත. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී වෙළඳපල මිල පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |

(ඇ) **1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිති සහ සේවා පනත**

**----------------**

| | | | |
|---|---|---|---|
| (i) 37 වගන්තිය | භාවිතා කරනු ලබන කිරුම් මිනුම් උපකරණ නිසි පරීක්ෂාවකින් තොරව හා මුද්‍රා තැබීමකින් තොරව භාවිතයට ගැනීම වරදක් වුවත් දෙහිවල සත්වෝද්‍යානයේ ගබඩාවේ ඇති ධාරිතාවය කිලෝග්‍රෑම් 150 ක් වූ මස්වල බර කිරීම සඳහා භාවිතා කරනු ලබන ඉලෙක්ට්‍රොනික් කිරුම් යන්ත්‍රය 2013 වර්ෂයෙන් පසු මුද්‍රා තබා නොතිබුණි. ඒ අනුව එම තරාදිය අනුමත දෝෂය ඉක්මවා බර අඩුවෙන් සටහන් වන බව කිරුම් මිනුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ පරීක්ෂාවේදී නිරීක්ෂණය වී තිබූ නමුත් මේ වන තෙක් එය නිවැරදි කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | පනත අනුව කටයුතු කළ යුතුය. |
| (ii) 43 වගන්තිය | යම් වැරදි සහිත කිරන හෝ මනින උපකරණයන් භාවිතා කිරීම වරදක් වුවත් ජාතික සත්වෝද්‍යානයේ කොළ අතු කිරා මිලදී ගැනීම සඳහා භාවිතා කරනු ලබන අනුක්‍රමික අංක 36058 දරන තරාදිය සම්බන්ධයෙන් කිරුම් මිනුම් දෙපාර්තමේන්තු නිලධාරීන් සිදු කළ පරීක්ෂාවේදී කිලෝග්‍රෑම් 22 ක අඩුවක් සහිතව මැනෙන බව නිරීක්ෂණය වී තිබුණි. ඒ අනුව අදාල තරාදිය භාවිතයෙන් ඉවත් කිරීමට නිර්දේශ කර තිබූ නමුත් මේ වන තෙක් එය ඉවත් කර නොතිබුණි. | පිළිතුරු ලැබී නැත. | පනත අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.73,024,137 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.448,955,427 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.375,931,290 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පාස්කු ප්‍රහාරය හේතුවෙන් සංචාරකයන්ගේ පැමිණීම අඩු වීම හා සත්ව ආහාර මිල ගණන් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අනුපාත වර්ගය | 2019 | 2018 |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 10 | 46 |
| ජංගම වත්කම් අනුපාතය (වාර) | 59 | 71 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (සියයට) | 1 | 7 |

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ජංගම වත්කම් අනුපාතය හීනවී තිබෙන අතර ඒ අනුව කෙටි කාලීන වගකීම් පියවීමේ හැකියාව අඩු වී තිබේ. වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය සැලකීමේදී පෙර වර්ෂයට සාපේක්ෂව පිරිහී තිබෙන අතර එයට ප්‍රධාන වශයෙන් විකුණුම් ආදායම පහත යාම හා සත්ව ආහාර මිලදී ගැනීමට වැඩි පිරිවැයක් දරා තිබීම හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථයක් වුවද 2011 වර්ෂයේ සිට පින්නවල අලි අනාථාගාරය තුල කිසිදු අලි පැටවකු උපත ලබා නොතිබුණි. ඒ හේතුවෙන් වැඩි සංචාරක ආකර්ෂණයක් පවතින ආසන්න වශයෙන් වර්ෂයකට රුපියල් මිලියන 03 ක පමණ ආදායමක් ඉපයූ අලි පැටවුන්ට කිරි පෙවීමේ අවස්ථාව සංචාරකයින්ට අහිමි වී ගොස් තිබුණි. | දෙපාර්තමේන්තුව මීට පිළියමක් ලෙස අලි ඇතුන් කෘතිමව අභිජනනය කිරීම සඳහා කටයුතු කරමින් පවතින අතර සුදුසු අලි පැටවුන් වනජීවී දෙපාර්තමේන්තුව හරහා ලබා ගැනීමට හැකිවුවහොත් මෙම ආදායම් තත්වය ඉහළ මට්ටමකට ගෙන යාමට හැකි වේ යැයි අපේක්ෂා කරන බව දන්වා සිටිමි. | මූලික පරමාර්ථ ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ලෝක සත්ව හා මින් මැදුරු පිළිබඳ සංවිධානය (WAZA) විසින් නිකුත් කර ඇති සත්ව සුබසාධක හා ආචාර ධර්මයන්හි 10 ඡේදය ප්‍රකාරව සතෙකු කැලයට හුරු කිරීම පියවරෙන් පියවර සිදු කළ යුතු වුවද ඊට පටහැනිව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් අලින් දෙදෙනෙකු අවස්ථා දෙකකදී කිසිදු පෙර පුහුණුවකින් තොරව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට මුදා හැර තිබුණි. | මෙම අලින් දෙදෙනාගේ හැසිරීම් ස්වභාවය අනුව පෙර පුහුණු වීම් සිදුකිරීමට නොහැකි තත්වයක් තිබූ බැවින් අලින් දෙදෙනාගේ සුභසාධනය වෙනුවෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් හොරොව්පතාන අලි රැඳවුම් මධ්‍යස්ථානයට මුදා හැරීම සිදුකරන ලදී. | ලෝක සත්ව හා මින් මැදුරු පිළිබඳ සංවිධානය විසින් නිකුත් කර ඇති ආචාරධර්ම පිළිපැදිය යුතුය. |
| (ඇ) | මෙම අලි දෙදෙනා රැඳවුම් මධ්‍යස්ථානයට ඇතුලත් කරන අවස්ථාවේ ක්‍රියාශීලීව, හොඳ දේහ තත්වයකින් සහ යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වී තිබුණද ප්‍රමාණවත් ආහාර නොලැබීම නිසා 2016 වර්ෂයේදී එක් අලියෙකු මිය ගොස් තිබූ අතර අනෙක් අලියා ජීවත්ව සිටියාද නැතහොත් මියගියාද යන්න පිළිබඳ තොරතුරු නොතිබුණි. | මෙම අලින් මිය ගොස් ඇති බව දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම සිදුකර නොමැති බව දන්වා ඇත. | ලෝක සත්ව හා මින් මැදුරු පිළිබඳ සංවිධානය විසින් නිකුත් කර ඇති ආචාරධර්ම පිළිපැදිය යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අක්කර 16 ක භූමි භාගයක පිහිටා ඇති ගෝනපල ගොවිපල, දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාක භක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් ආහාරවලින් | ගොවිපල තුළ ප්‍රධාන වශයෙන් CO4 තණකොළ බ්‍රිසන්තා තණකොළ කංකුං උක්ගස් හා කෙසෙල් වගා කිරීම සිදු කරනු ලබන අතර මෙම | නියමිත සැලැස්මකට අනුව බෝග වගා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොටසක් සැපයීම පිණිස පිහිටුවා තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළව වගාකළ යුතු බෝග පිළිබඳ සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි. ඒ හේතුවෙන් සත්වෝද්‍යානයේ දෛනික අවශ්‍යතාවය ඉලක්ක කර ගනිමින් කිසිදු බෝගයක් වගා කර නොතිබුණු අතර වගා භූමිය වැඩි අස්වැන්නක් ලබා ගැනීමට හැකි වන අයුරින් නිර්මාණය කර නොතිබුණි. | බෝග ප්‍රවාහයන් දෙහිවල සත්වෝද්‍යානය වෙත ලබා දීම සිදු කරයි. | |
| (ආ) | ගොවිපලේ වගාවන් සඳහා කාබනික පොහොර වශයෙන් අලි වසුරු භාවිතා කර තිබුණද දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ඉවත ලන වෙනත් අබලි ද්‍රව්‍ය ද එම වසුරු සමඟ ගොවිපලට ගෙනවිත් දමා තිබූ බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කිරීම. | නියමිත පරිදි අලි වසුරු ගෝනපල ගොවිපලට ලබාදිය යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රිදියගම සෆාරි උද්‍යානයේ රු.මිලියන 7.2 ක ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන 12 ක් 2018 මාර්තු 22 වන දින අවසන් කර තිබුණද 2020 ජූනි දක්වා භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රීයව තිබුණි. | මෙම විකුණුම් මධ්‍යස්ථාන භාවිතයට නොගෙන නිෂ්කාර්යය පවතින බව දන්වා ඇත. | වත්කම් නිසි පරිදි භාවිතයට ගත යුතුය. |

**3.4** **ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉදි කිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මගින් නිකුත් කර ඇති අංක ICTAD/SBD/01 දරන ප්‍රකාශනයේ 59.2 වගන්තිය පරිදි ඉංජිනේරුවරයාගේ අවසරයකින් තොරව හෝ දින 28 ක් පුරාවට වැඩ නවතා දමා ඇති ඉදිකිරීමට අදාලව කොන්ත්‍රාත්කරුගේ සේවය අවසන් කල යුතුය. එසේ වුවද හම්බන්තොට සෆාරි උද්‍යානයේ ඉදිකරමින් පවතින ඇස්තමේන්තුගත පිරිවැය පිළිවෙලින් රු.මිලියන 11 ක් හා රු.මිලියන 2 ක් වූ සිංහ අරණ හා අප්‍රිකානු අලි කලාපයේ ව්‍යාපෘති පිළිවෙලින් 2017 ජූලි 29 දිනට හා 2018 මාර්තු 24 දිනට වැඩ අවසන් කළ යුතු වුවත් ඉහත පරිදි කටයුතු නොකර අතරමඟ නවතා දමා තිබුණි. මේ වන විට එම ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.මිලියන 2.3 ක් හා රු.මිලියන 1.7 ක් වැය කර තිබුණි. | අප්‍රිකානු අලි කලාපය ව්‍යාපෘතිය නිම කිරීම කඩිනමින් සිදුනොකළ හොත් එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර කර වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනැමීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. සිංහ අරණ ව්‍යාපෘතිය මේ වන විට සියයට 60 ක පමණ ඉදිකිරීම් සිදුකර ඇති බැවින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය මගින් එහි ඉදිකිරීම් කටයුතු අවසන් කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ගිවිසුම පරිදි කටයුතු කළ යුතුය. |